# සාන්ත බර්තොලමෙව් අපෝස්තුළු තුමා
## මංගලයය

## පළමුවන දේව ප්‍රකාශනය එළිදරව්ව 21: 9-14

*එළිදරව්ව පොතෙන් උපටා ගත් කොටසකි.*

"නුවර පවුරේ අත්තිවාරම මත ප්‍රේරිතවරුන්ගේ නාම ලියා තිබිණි."

අන්තිම වසංගත සතෙන් පිරුණු පාත්‍ර සත දැරූ දේව දූතයන් සත් දෙනාගෙන් එක් තැනැත්තෙක් මා වෙත පැමිණ, "එන්න, බැටළු පෝතකයාණන්ගේ බිරිඳවන මනාලිය ඔබට පෙන්වන්නෙමි"යි කී ය. ආත්මයාණන්ගේ ආනුභාවයෙන් ඔහු මහා උස් කන්දකට මා ගෙන ගොස, ශුද්ධ නගරය වූ ජෙරුසලම දේව තේජසින් විරාජමාන ව, දෙවියන් වහන්සේ වෙතින් ස්වර්ගයෙන් බැස එනු මට පෙන්වී ය. ඒ නගරයේ දීප්තිය ඉතා අනර්ඝ මාණික්‍යයක් මෙන් එනම්, පළිඟු මෙන් විනිවිද පෙනෙන සූර්යකාන්ත ගලක් මෙන් විය. වාසල් දොරටු දොළොසකින් යුත්, මහ උස් පවුරක් එය වටේ තිබිණි. ඒ දොරටු ළඟ දේව දූතයෝ දොළොස් දෙනෙක් වූ හ. ඒවා පිට ඉශ්රායෙල් පුත්‍රයන්ගේ ගෝත්‍ර දොළොසේ නාම ලියා තිබිණි. නැගෙනහිරින් දොරටු තුනක් ද උතුරෙන් දොරටු තුනක් ද දකුණෙන් දොරටු තුනක් ද බස්නාහිරෙන් දොරටු තුනක් ද විය. නුවර පවුරෙහි අත්තිවාරම් දොළොසක් විය. ඒවා පිට බැටළු පෝතකයාණන්ගේ ප්‍රේරිතයන් දොළොස් දෙනාගේ නාම දොළොස ලියා තිබිණි.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 145: 10–13, 17–18

පිළිතුර : සමිඳුනි, අපි ඔබ වහන්සේගේ රාජ්‍යයේ මහිමය ගායනා කරමු.

ගීය : සමිඳුනි, ඔබ මැවූ සියලු දේ ඔබට තුති පුදයි:
ඔබේ සැදැහැවත්තු ද ඔබට ප්‍රශංසා කරති.
ඔව්හු ඔබේ රාජ්‍යයේ මහිමය වර්ණනා කරති.
ඔබේ බල මහිමය ගැන ද කතා කරති.

එසේ කරන්නේ, දෙවිඳුන්ගේ ප්‍රබල ක්‍රියාත්,
රාජ්‍යයේ තේජෝ මහිමයත්
මිනිසුන් හට දන්වන පිණිස ය.
ඔබේ රාජ්‍යය සදාකාලික ය, ඔබේ ආධිපත්‍යය ද
සියලු පරම්පරාවල ම පවත්නේ ය.

සමිඳාණෝ සැම අතින්ම සාධාරණ ය.
එතුමන්ගේ සියලු ක්‍රියා දයාන්විත ය.
අයැදින සියල්ලන්ට සමිඳාණෝ ළං ව සිටින සේක.
අවංක සිතින් යදින්නන්ට ආසන්නව සිටින සේක.

## සුපුවත් ජය නද ජොහන් 1: 49

ආලේලූයා! ආලේලූයා!
“ගුරුදේවයෙනි, ඔබ වහන්සේ නම්,
දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය:
ඉශ්රායෙල්හි රජිඳාණෝ ය.”
ආලේලූයා!

## සුවිශේෂය

ජොහන් 1: 45–51

*සුවිශේෂක ජොහන් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"මෙන්න, හොර බොරු නැති සැබෑ ඉශ්රායෙල් ජාතිකයෙක්."

පිලිප් ද නතානියෙල් සොයා ගෙන, "මෝසෙස් ව්‍යවස්ථාවලියෙහි හා දිවැසාවලියෙහි සඳහන් කර ඇති තැනැත් වහන්සේ, එනම්, ජෝසෙප්ගේ පුත් නාසරෙත්හි ජේසුස් වහන්සේ අපට හමු වූ සේකැ"යි කී ය. නතානියෙල් ද කතා කරමින්, "වැදගැම්මක් ඇති කිසිවක් නාසරෙතින් නික්මේ දැ"යි ඇසී ය. "ඇවිත් බලන්නැ"යි පිලිප් කී ය. ජේසුස් වහන්සේ නතානියෙල් තමන් වෙත එනු දැක, "මෙන්න, හොරබොරු නැති, සැබෑ ඉශ්රායෙල් ජාතිකයෙකැ"යි ඔහු ගැන වදාළ සේක. "ඔබ මා ගැන කෙසේ දන්නෙහි දැ" යි නතානියෙල් උන් වහන්සේගෙන් ඇසී ය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "පිලිප් ඔබ කැඳවන්නට පෙර, අත්තික්කා ගස යට ඔබ සිටිනු මම දිටිමි" යි වදාළ සේක.

නතානියෙල් උත්තර දෙමින්, "ගුරුදේවයෙනි, ඔබ වහන්සේ නම්, දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය: ඔබ වහන්සේ නම්, ඉශ්රායෙල්හි රජිඳාණෝ ය"යි කී ය. ජේසුස් වහන්සේ ද පිළිතුරු දෙමින්, "ඔබ අත්තික්කා ගස යට සිටිනු මම දිටිමි, යි මා ඔබට වදාළ බැවින් ද, ඔබ අදහා ගත්තේ? මීට වඩා මහත් දේ ඔබ දකින්නෙහි ය"යි වදාළ සේක. තවදුරටත් උන් වහන්සේ කතා කරමින්, "ඒකාන්තයෙන් මම ඔබට කියමි: ස්වර්ගය විවර වී, මනුෂ්‍ය–පුත්‍රයාණන් වෙත දෙවියන් වහන්සේගේ දූතයන් නැග යනවාත්, බැස එනවාත් ඔබ දකින්නෙහි ය"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*